| *අනු. අංකය* | *පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| | *කුසලතාව*<br>(I) අධ්‍යාපන සුදුසුකම් :<br>නිලධාරීන් සේවයට බඳවාගැනීමේ දී සලකා බලනු ලැබූ මූලික සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විශේෂඥතා ක්ෂේත්‍ර වර්ගීකරණයකට අදාළ හෝ අයදුම්පත් කැඳවා ඇති තනතුරට අදාළ වූ අධ්‍යාපන සුදුසුකම් පමණක් සැලකීමට ලක්කරනු ලැබේ.<br><br>අ. පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය - ලකුණු 15<br>ආ. පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 10<br><br>• ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 15 | |
| | (II) වෘත්තීය සුදුසුකම් :<br><br>අ. (i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (දේශීය/විදේශීය) - ලකුණු 10<br>(ii) එම ක්ෂේත්‍රයේ මාස 06ක් හෝ ඊට වැඩි වසරකට අඩු පාඨමාලා සඳහා - ලකුණු 05<br><br>*සටහන :*<br>පහත දැක්වෙන අන්තර්ජාතිකව පිළිගත් වෘත්තීය සහතික (Professional Certifications) සඳහා කාල සීමාව නොසලකා ඉහත 02 (II) අ. (i) යටතේ සැලකීමට ලක් කෙරේ.<br><br>1. BCS / ACS<br>2. Microsoft Certifications<br>3. Sun Certifications<br>4. Cisco Certifications<br>5. CISSP Certifications | 10 | 40 |
| | (III) විශේෂ කාර්යයන්/දායකත්වයන් :<br><br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ව සිදු කරන ලද නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් හා ජයග්‍රහණ, ත්‍යාග, ප්‍රශංසා සඳහා මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>අ. පහත දක්වා ඇති ක්ෂේත්‍ර ආවරණය වන නව නිර්මාණ, වැඩිදියුණු කිරීම්, ජයග්‍රහණ හෝ ත්‍යාග සඳහා එකකට ලකුණු 02 බැගින් උපරිම අංග 5ක් සඳහා - ලකුණු 10<br><br>1. මෘදුකාංග නිර්මාණය/සංවර්ධනය (Software Design/Development)<br>2. ජාල පරිපාලනය (Network Administration)<br>3. පද්ධති පරිපාලනය (System Administration)<br>4. දත්ත පාදම පරිපාලනය (Data Base Administration)<br>5. සාමාන්‍ය තොරතුරු සංනිවේදන කටයුතු සහ වෙනත් (General ICT Tasks & etc.) | 10 | |

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | හාළි ඇල | හාළිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

09-27

---

සංශෝධනයයි

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් (දෙමළ මාධ්‍යය) තනතුර බදුල්ල දිස්ත්‍රික්කය — අයදුම්පත් කැඳවීමේ දැන්වීම සංශෝධනය කිරීම

බදුල්ල දිස්ත්‍රික්කය

අංක 2344 හා 2023.08.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදනය කර තිබූ බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දපල්ල නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා හපුතලේ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) ලෙස සටහන් වීම පහත උපලේඛනයේ සඳහන් තනතුර ලෙස සංශෝධනය විය යුතු බව හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2023.10.02 දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාසය, තනතුර හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙ හි සඳහන් අනෙකුත් කරුණු සියල්ල ම එලෙස ම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාසය හා තනතුර* |
|---|---|---|
| බදුල්ල | හල්දුම්මුල්ල | කන්දපල්ල බටහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා හපුතලේ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) |

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-28

